සංස්කරණය/Editor
අසෝක සුබසිංහ Asoka Subasinghe

උපදේශක සංස්කාරක
ජගත් ජේ එදිරිසිංහ Jagath J Edirisinghe

සංස්කරණ සහය/Asst. Editors
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

ක්‍රීඩා සංස්කාරක
අසෝක සිල්වා Asoka Silva

සන්නස පිරිවර

සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියානි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

සේයා රූ
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

පිටු සැකසුම සහ ග්‍රැෆික් නිර්මාණ
Page Layout & Graphic Designs

සාමන්ත තැන්නගේ Saamantha Tennege

සමබන්ධීකරණය

NSW	WA
Lakshman Kodituwakku	Kapila Hemantha
02 9626 7660	Balage
02 9837 5055	08 9456 1972
QLD	**ACT**
Ananda Samaratunga	Asoka Nimalasiri
07 3372 7953	0400 429 031
SA	**TAS**
Chandra Eeriyagama	Anura Seneviratne
08 8331 2318	03 6327 4259

Sannasa
61 Nettle Drive
Hallam Vic 3803 Australia
Web: www.sannasa.net
email : sannasanews@gmail.com
Tel/Fax : 03 9796 4241

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත.

CIRCULATION - 10000 COPIES IN AUSTRALIA

සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය ඉතා කෙටියෙන් ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සලකන්න.

ජනමාධ්‍ය සහ රජය

ජනමාධ්‍ය ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකාව තුළ අද දවසේ සිදුවන මර්ධනකාරී ක්‍රියා ලොව පුරා නිදහස් මත ධාරීන්ගේ සැළකිල්ලට භාජනය වී ඇත. සිරස රූපවාහිණියට ගිණි තැබීම සන්ඩේ ලීඩර් කර්තෘ ලසන්ත වික්‍රමතුංග මරා දැමීම සහ රිවිර කර්තෘ උපාලි තෙන්නකෝන් මරා දැමීමට තැත් කිරීම වැනි ක්‍රියා කෙසේ සිදුවන්නේද යන්න අභිරහසකි.

කවුරුන් කළ ද කිසිදු ශිෂ්ට සම්පන්න ජාතියක් නොඉවසන මෙවන් සාහසික ක්‍රියා මැඩ පැවැත්වීමේ වගකීමෙන් පැන යන්නට රජයට අවසරයක් නැත. උදාසීන ලෙස කරගෙන යනු ලබන පොලීසියේ පරීක්ෂණ ඉක්මන් කරවීමත් වගකිවයුත්තන් අල්ලා නීතිය ඉදිරියට ගෙන ඒමත් රජයේ වගකීම වන්නේ ය. රජය මේ වගකීම පැහැර හරිනතාක් මේ පහරදීම් ජනිත කළ අපකීර්තිය විඳ ගන්නට රජයට සිදුවනු ඒකාන්තය. මේ පහර දීම් සම්බන්ධයෙන් ප්‍රදර්ශනාත්මක විරෝධය පෑමේ රංගනයෙන් බැහැරව සාහසිකයන් අල්ලා ගැනීමේ සැබෑ ක්‍රියාකාරීත්වයක් පෙන්වීම අද දවසේ රජයේ වගකීම වන්නේ ය.

නිදහස

ශ්‍රී ලාංකීය ඉතිහාසයට පෙබරවාරි මාසය යනු ඉතා වැදගත් සංධිස්ථානයක් සනිටුහන් කළ මාසයකි. 1948 සිට අද දක්වා ද අපි එය සමරමු. නිදහස ගැන විවිධ දේ කියමින් නිදහසම ඉල්ලමින් අපි තවමත් නිදහස සොයා යමින් සිටිමු. එදා රටක් වශයෙන් නිදහස සොයා ගිය අපට, අද එ රටෙහි ආර්ථික, දේශපාලනික, සමාජයීය නිදහස සොයා යන්නට සිදුව ඇත.

නිදහස නිසා සාමය ද, සාමය නිසා නිදහස ද ඇති වෙයි. ඉන් එකක් හෝ නැති වූ තැන සියල්ල නැති වෙයි. මිනිසාගේ නිදහස් ආකල්ප, නිදහසේ ගොඩ නැගී නිදහස් සමාජයක් උදා වන තුරු අපි බලා සිටිමු.

ශ්‍රී ලංකාවේ මාධ්‍ය මර්ධනය මාධ්‍ය විකෘතිය

පුවත්පත් කලාවේදියෙකුට මැරවරයෙකු පහරදීමේ පලමු සිඩිය වාර්ථා වූයේ 1965 මාර්තු පලවන සතියේදී ලේක්හවුස් මන්දිරයෙනි. ඒ අධ්‍යක්ෂකවරයෙකු ගේ, ආරක්ෂකයෙකු නවලෝකය හා මිහිර පත්‍රවල ප්‍රධාන කතෘ, ලියනගේ මහතා ට බරපතල ලෙස පහරදීමයි. ලියනගේ මහතාගේ විජයවර්ධන පවුලට ඇති, භක්තිය නිසා ඔහු මෙම සිඩියය ඉදිරියට ගෙන නොගියේය. සියළුම පුවත්පත් මේ සිඩියය වසංකල ද ඇත්ත පුවත්පත එය මුල්පිටුවේ ම වාර්ථා කලේය.

මා පුවත්පත් කියවන්නට පටන් ගත්තේ දස හැවිරිදි වියේදීය. එනම් 1932 පමණය. එසේවූයේ මගේ පියා "පත්තර පිස්සෙක්" වූ නිසාය. ඒ දවස්වල දිනපතා පලවූයේ එක පත්තරයකි. "සිංහල" එනම් දිනමිණ යි.

මේ අතර සතිපතා අපේ ගෙදරට සිංහල බෞධයා, සරසවි සඳරැස, ස්වදේශ මිත්‍රයා, සිළුමිණ ද නිතර "වඩම්මවන ලදී".

එකල සිළුමිණ හැඳින්වූයේ " සත දහයේ විශ්ව විද්‍යාලය" නම්නි. එහි කිවන්නට බොහෝ දේ තිබූ නිසාත්, ඒවා ශිෂ්ඨ සම්පන්නව ඉදිරිපත් කිරීම නිසාත් මේ නම පටබැඳුනා වියහැකිය.

1936 ලංකාවේ දේශපාලන නව සංකල්ප උදාවීමත් සමග පත්තර කන්තෝරු වලටද "පොඩිපහේ පිස්සුවක්" වැලඳෙන්නට පටන් ගත්තේය. විශේෂයෙන්ම ලේක්හවුස් මන්දිරයේ පුවත්පත්, ලංකා සමසමාජ පක්ෂය හා එහි මන්ත්‍රීවරුන් හෝ පිලිප් ගුණවර්ධන සහ ආචාර්ය එන්. එම්. පෙරේරාත් ඉලක්ක කරගනිමින් වැඩිපුරම පහර ගැසුවේ, සමසමාජ න්‍යායයට හා මාක්ස්වාදී දර්ශනයන්ට ය. ඉංග්‍රීසි පුවත්පත්, මේ කටයුත්ත ඉතා පරිස්සමෙන් කල අතර සිංහල අංශයේ ලේඛකයෝ කිහිපදෙනෙක් "දෙන්නම් බැටේ" තාලයට පැන හපුරවන්නට වූහ.

මේ "සෙල්ලම" උච්චස්ථානයට පත්වූයේ, 1937 අරුම පුදුම නඩු වාර්ථාවකිනි.

තම දියණිය දූෂණය කිරීමේ චෝදනාව පිට "නිරිසන්" මිනිසෙකු උසාවියට ඉදිරිපත් කරන ලදි. ඔහු ගේ නීතිඥයා ප්‍රශ්න කලවිට විත්තිකරු පැවසුවේ, තමා සමසමාජ පක්ෂයේ සාමාජිකයෙකු බවත්, සමසමාජ ධර්මය අනුව, තමා කලේ වරදක් නොවන බවත්ය. මේ අරුම පුදුම ප්‍රකාශය පිලිනොගත් විනිශ්චයකාරකවරයා ඔහු බරපතල වැඩ ඇතුව බන්ධනාගාරගත කලේය.

දිනමිණ පත්‍රයේ පොල් ගෙඩි සිරස්ථල වලින් පලවූයේ නඩුවාර්ථාවේ මේ කොටස පමණකි.

ඊට සතියකට හෝ දෙකකට පසුව සත දෙකට විකුණන ලද සමසමාජය පත්‍රයේ නඩු විස්තරය සම්පූරණයෙන් පලවී තිබුණේය. එහි හෙළිකරන ලද කරුණු අනුව පැමිණිල්ලේ නීතිඥ වරයා විත්තිකරුගෙන් දෙවනවර අසන ලද, හරස් ප්‍රශ්ණ දිනමිණේ වාර්ථාවූයේ නැත. ඒ ප්‍රශ්ණ මෙසේය,

නීතිඥ - ඔබ සමසමාජ පක්ෂයේ සාමාජිකයෙකු කීවා නේද?

විත්තිකරු - ඔව් මම සාමාජිකයෙක්.

නීතිඥ - ඒ පක්ෂයේ සභාපතිවරයා කවුද?

විත්තිකරු - ආ..... මේ එන්. එම්. පෙරේරා මහත්තයා.

නීතිඥ - හා.....ලේබම්?

විත්තිකරු - පිලිප් ගුණවර්ධන.

නීතිඥ - (සිනාසෙමින්) ස්වාමීණී එපමණයි.

එකල සමසමාජ පක්ෂයේ සභාපති වූයේ ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා ය ලේකම්වරුන් වූයේ, වර්නන් ගුණසේකර හා එම්. ටී. මෙන්ඩිස් යන දෙදෙනා ය.

විත්තිකරු සමසමාජය ගැන කීවේ අමූලික බොරුවක් බවද විනිශ්චයකරුද පිලිත්තේය.

ප්‍රශ්ණය මෙතැනින් ඉවරවූයේ නැත. දිනමිණේ පුවත පලවූ පසු ඉරිදා සිළුමිණ කතුවැකියට තෝරාගත්තේ මේ නඩු විභාගයයි. ඔවුන් කතා කලේ නඩුවට වඩා මාක්ස්වාදය පදනම්කරගත්, සමසමාජක්‍රමය, කොතරම් අශික්කිත ධර්මයක්ද යන්න විග්‍රහ කිරීමටයි.

පුවත් පතකට කොතරම් දුරට ඉතිහාසය විකෘති කල හැකිදැයි මේ සිඩියයෙන් හෙළිදරව් වූවේය.

මේ සිද්ධියට සම්බන්ධ තවත් සිද්ධියක් මම 1962 දී ලියූ "තාත්තයි පුතයි" යන කාලීන

37 වන පිටුවට



ඉන්දියාවේ හිටපු නියෝජ්‍ය මහ කොමසාරිස්

එස්. පියසේන